# පුරප්පාඩු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

### (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (නීති) සහ කළමනාකරණ සහකාර (ලඝු ලේඛක හා යතුරු ලේඛක) තනතුරු සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛ අංක 01/2025 අනුව වැටුප් ගෙවනු ලැබේ.

**අධ්‍යක්ෂ (නීති) - තනතුරු 01**

**සුදුසුකම් :**

බාහිර අයදුම්කරුවන්

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දී තිබීම

**සහ**

නීති ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි (Master of Law) සුදුසුකම් ලබා තිබීම

**සහ**

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නීති කෘතයන් සඳහා පෙනී සිටීම ඇතුළත්ව තනතුරුට අදාළව නීති ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද

අභ්‍යන්තර අයදුම්කරුවන් – (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම
2. කළමනාකාර (MM) සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර තුනක (03) ක අදාළ විෂය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම, සහ (MM 1 - 1) වැටුප් කාණ්ඩයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව තිබීම

**වයස :** අවුරුදු 35 නොඅඩු හා 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**වැටුප් ක්‍රමය** - HM 1-1 – 2025 – රු. (140,640 – 15 X 4, 100 – 202, 140)

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | | |
|---|---|---|
| 01. | අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කාර්ය සාධනය | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

**කළමනාකරණ සහකාර (ලඝු ලේඛක හා යතුරු ලේඛක) - තනතුරු 02**

**සුදුසුකම් :**

බාහිර අයදුම්කරුවන්

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම

**සහ**

(ඇ) තෘතියික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය පිළිබඳ මාස 06 කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ' 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කල හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල/දෙමළ

ii. ගණිතය

iii. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් යන (06) කින් සමත්ව තිබීම.

(පරිගණක වදන් සැකසුම / යතුරු ලියන පිළිබඳ තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුයි.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**සටහන් :-** යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත ඉ ජේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේ ඉහත ඉ ජේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමෙන් පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**වයස :** අවුරුදු 18 නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**වැටුප් ක්‍රමය** - MA 1-2 – 2025 – රු. (46,220 – 10 X 540– 7 X 630 – 12 X 1,080 – 12 × 1,280 – 84,350)

බඳවා ගැනීමේ ක්‍රමවේදය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

අයදුම්කරුවන් සහතිකවල ඡායා පිටපත් සමඟ තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් 2026.01.05 දින ප.ව. 4.00 ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි "අධ්‍යක්ෂ (නීති)" හෝ "කළමනාකරණ සහකාර (ලඝු ලේඛක හා යතුරු ලේඛක)" ලෙස සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203,**
**ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.**